**කොටගල ප්‍රාදේශීය සභාව - 2020**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 මතය

**-------**

කොටගල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට **කොටගල** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,100,415 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,779,040 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු** | | |
| I. | වරිපනම් හා බදු සඳහා ඇස්තමේන්තු අගය ඉක්මවා සියයට 141 ක් ද, වෙනත් ආදායම් සඳහා ඇස්තමේන්තු අගය ඉක්මවා සියයට 563 ක් ද බිල් කිරීමෙන් ආදායම් ඇස්තමේන්තු සැකසීම නිසි ලෙස ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගනිමි. | ආදායම් ඇස්තමේන්තු සැකසීම නිසි ලෙස ඉටු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| II. | වරිපනම් හා බදු සඳහා බිල්කළ ආදයමෙන් රැස්කළ ආදායම සියයට 62 ක් වැනි අඩු අගයක පැවතිණි. රු.3,408,429 ක් වූ හිඟ මුදලින් සියයට 48 ක් වසර 3 කට වඩා පැරණි ශේෂයන් වුයෙන් හිඟ ආදායම් අයකර ගැනීම කාර්යක්ෂමව ඉටු වී නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගනිමි. | ආදායම් රැස්කිරීම නිසි ලෙස ඉටු කළ යුතුය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 258 හා 259 වගන්ති ප්‍රකාරව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| III. | සභාව සතු ලොක්හිල් කොළණියේ සහ ක්‍රිස්ලස්ෆාම් හි පිහිටි ඉඩම් කැබලි 30 ක බදුකරුවන් විසින් මාස 13 සිට මාස 38 දක්වා කාල පරාසයකට අදාළව රු. 109,883 ක බදු කුලී ගෙවා නොතිබුණි. සමීක්ෂණයක් මඟින් බදුකරුවන් හා අදාළ ඉඩම් කැබලි නිවැරදිව හඳුනාගෙන විධිමත් ගිවිසුමකට එළඹීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගනිමි. | ආදායම් රැස්කිරීම නිසි ලෙස ඉටු කළ යුතු අතර ගිවිසුමකට එළඹීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |
| (ආ) | **කඩ කුලී**<br>----------- | | |
| | සභාව සතුව පැවති කඩ කාමර 60 කින් කඩ කාමර 4 ක බදුකරුවන් සමඟ පමණක් සභාව බදු ගිවිසුම්වලට එළඹ තිබුණි. | මාස 03 ක් ඇතුළත ගිවිසුම්ගත වී අවසන් කරමි. | ආදායම් රැස්කිරීම විධිමත්ව සිදු කළ යුතු අතර බදුකරුවන් සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>**--------------------------------** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.4,799,115 ක් විය. | අයකර වාර්තා කරමි. | ආදායම් රැස්කිරීම නිසි ලෙස ඉටු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**---------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හෙක්ටයාරයකට වැඩි ඉඩම් අනුබෙදීමකදී වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ විශාලත්වයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන්කර දිය යුතු වුවත්, එහෙත් එවැනි අනුබෙදීම් කළ කුඩාඔය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඩාඔය වත්ත නමැති ඉඩමෙන් 2018 වර්ෂයේදී සභාව වෙත පවරා දෙන පර්චස් 27.46 ක් සහ 27.55 ක් වූ බිම් කැබලි දෙක එවැනි ප්‍රජා කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් නොව ශීඝ්‍ර බෑවුමක් සහිත ස්ථානයකින් ලබාගෙන තිබුණි. | ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කරමි. | ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් ඉඩම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි අයදුම්පත්‍ර 40 ක් ලැබී තිබූ අතර ඉන් අයදුම්පත්‍ර 20 ක් පමණක් අනුමත කර තිබුණි. | සැලැසුම් කමිටු පවත්වා අනුමත කිරීමට කටයුතු කරමි. | කාර්යක්ෂමව අනුමත කිරීමේ කටයුතු සිදු කළ යුතු වේ. |
| (ආ) | මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි /නියෝජන ලේඛන ගත කිරීම හා ඒවා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග සඳහන් කරන ලේඛනයක් නඩත්තු කර තිබුණද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. සභාව වෙත සමාලෝචිත වර්ෂය සඳහ ජල ගැටළු, ඉඩම් ගැටළු, ආපදා තත්ත්වයන් ආදිය පිළිබඳව මහජන පැමිණිලි 95 ක් ලැබී තිබුණද ගත් ක්‍රියාමාර්ග සඳහන් කර තිබුණේ පැමිණිලි 05 ක් සම්බන්ධයෙන් පමණි. ඒ අනුව පැමිණිලි 90 ක් වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න ලේඛනයේ සඳහන් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගනිමි. | ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට හා මහජන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.3 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. 5,600,000 ක් වටිනා පර්චස් 25.1 ක ඉඩම්ද වටගොඩ පොදු වැසිකිළිය පිහිටා ඇති ඉඩමද එයට ප්‍රවේශ මාර්ගයක් නොවූයෙන් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම වත්කම් ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. | වත්කම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | රු.1,745,820 ක් වැයකර ඉදිකර මාස 06 කට අධික කාලයක් ගතවී තිබුණද, වටගොඩ මාළු වෙළඳසැල භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | දෙවරක් ටෙන්ඩර් කැඳවූ නමුත් ලංසු ඉදිරිපත් නොවූ බව දන්වමි. | ඉදිකිරීම අරමුණුගත කාර්ය වෙනුවෙන් යෙදවිය යුතු වේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා නිම කරන ලද විවිධ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඉටුකරන ලද, කර්මාන්ත 14 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් ඉටු කළ ප්‍රජා පාදක සමිති වෙත රු.2,634,646 ක මුදලක් ගෙවීම් කිරීමට පැවතියද කර්මාන්ත ඉටුකිරීම වෙනුවෙන් සභාව වෙත ලැබිය යුතුව පැවතියේ කර්මාන්ත 07 ක් වෙනුවෙන් රු.1,078,648 ක මුදලක් පමණක් වුයෙන් රු.1,555,998 ක මුදලක් සභා අරමුදලින් දැරීමට සිදුවී තිබුණි. | ඉදිරියේදී මෙම කර්මාන්ත නිම කිරීමට පියවර ගෙන විගණනය දැනුවත් කරමි. | කර්මාන්ත ඉටු කර මහජන සේවය නොපිරි හෙලා ඉටු කළ යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමණාකරණ සහකාර සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ රාජකාරි සහ වෙනත් විෂය රාජකාරිද, 2017 වර්ෂයේ සේවයට බැඳුණු විගණන කටයුතු පිළිබඳව පුහුණුවක් නොලද නවක කළමනාකරණ සහකාර නිළධාරියෙකුට පැවරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, නිළධාරියාගේ වැටුප ලෙස රු.350,880 ක් වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි. | 2021 වර්ෂය සඳහා විගණන සැලැස්මක් සකස් කර ඇති බව දන්වමි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. |

## 4.2 පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් කසළ කළමනාකරණය සඳහා 2020 වර්ෂය තුළ සැලස්මක් සකස් කර තිබුණු අතර වර්ෂයකට කසළ ටොන් 1460 ක් පමණ එකතු කරනු ලබයි. සභාවේ සෞඛ්‍ය අංශයේ තත්‍ය වියදම රු.10,125,034 ක් වුවද, එයින් කසළ කළමනාකරණය සඳහා දැරූ වියදම වෙන්කර හඳුනාගත නොහැකි විය. වාර්ෂිකව දිරන කසළ ටොන් 912.5 ක් කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගෙන තිබූ අතර, ප්‍රතිචක්‍රීයකරණය කරන කසළ වර්ෂයකට ටොන් 365 ක් පමණ වේ. එකතුවන කසළ ප්‍රමාණයෙන් වාර්ෂිකව ප්‍රතිචක්‍රීකරණයට භාජනය නොවන කසළ ප්‍රමාණය ටොන් 182.5 ක් පමණ වන අතර මිශ්‍රව ලැබෙන මෙම කසළ ප්‍රමාණය පතන කසළ අංගනයේ බිම් පිරවුම් සඳහා යොදා තිබුණි. | අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | කසළ කළමනාකරණය විධිමත් කළ යුතු වේ. |
| (ආ) | පතන කොම්පෝස්ට් අංගනය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩි දියුණු කර එය සභාවේ ආදායම් මාර්ගයක් බවට පත් කර ගැනීමේ හැකියාවක් පැවතියද ඒ පිළිබඳ සභාවේ අවධානය යොමුවීම අවම මට්ටමක පැවතුණි. | වැඩිදියුණු කිරීම සඳහා නිලධාරියෙක් පත්කර ඇති බව දන්වමි. | කසළ කළමනාකරණය විධිමත් කළ යුතු වේ. |
| (ඇ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතනයක් සඳහා 2021 පෙබරවාරි 21 විගණිත දින වන විටත් වාර්ෂික බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බල පවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |